# දැන්වීමයි

## කැලණිය විශ්වවිද්‍යාලය - ශ්‍රී ලංකාව

## පීඨ ශිෂ්‍ය සමිතියට නියෝජිතයින් තෝරා පත් කර ගැනීම 2023/2024 අධ්‍යයන වර්ෂය

1985 අංක 07 සහ 1988 අංක 26 දරන පනත්වලින් සංශෝධිත පරිදි 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතෙහි 135 ඡේදය හා 112 (3) ඡේදය යටතේ කැලණිය විශ්වවිද්‍යාලයෙහි පාලක සභාව විසින් පනවන ලද 2023 අංක 01 දරන ශිෂ්‍ය සමිති අතුරු ව්‍යවස්ථාවෙහි 8 (1) ඡේදය ප්‍රකාර කර ඇති නියමයන් පහතින් දක්වා ඇති අතර මතු දැක්වෙන (ආ) හි නිලධාරීන් හා වෙනත් සාමාජිකයින් තෝරා පත් කර ගැනීමේදී 2022.06.07 දින පැවති 503 වැනි පාලක සභා වාරයේ අංක. 503/10 හි අනුමැතියෙන් දක්වා ඇති නියමයන් අනුව කටයුතු කළයුතු බව දැනුම්දෙමි.

**(අ) පීඨ ශිෂ්‍ය සමිතියේ නම**

1. වෛද්‍ය පීඨ ශිෂ්‍ය සමිතිය

**(ආ) පීඨ ශිෂ්‍ය සමිතියට තෝරා ගත යුතු නිලධාරීන්ගේ නිල නාමයන් සහ වෙනත් සාමාජික සංඛ්‍යාව**

(අ) සභාපති

(ආ) උප සභාපති

(ඇ) ලේකම්

(ඈ) සංස්කාරක

(ඉ) කනිෂ්ඨ භාණ්ඩාගාරික

(ඊ) වෙනත් සාමාජිකයන් 08 දෙනෙකු (වෛද්‍ය විද්‍යා හා ශල්‍ය වෛද්‍ය විද්‍යා උපාධිය හදාරන ශිෂ්‍යයින් උපරිම 05 දෙනෙකු පත් කර ගත හැකි අතර, පළමු වසරින් අයෙක් හා දෙවන හා තෙවන වසර වලින් දෙදෙනෙකු බැගින් නියෝජනය වීම අපේක්ෂා කෙරේ. කථන හා ශ්‍රවණ විද්‍යාවේදී ගෞරව උපාධිය හා වෘත්තීය චිකිත්සා විද්‍යාවේදී ගෞරව උපාධිය යන ඕනෑම උපාධි පාඨමාලාවක් හදාරන අවසන් වසර හැර අනිකුත් ඕනෑම වසරකින් ශිෂ්‍යයින් 03 දෙනෙකු පත් කර ගැනීම අපේක්ෂා කෙරේ).

- පීඨ ශිෂ්‍ය සමිතියේ නිලධාරීන් හා වෙනත් සාමාජිකයින් තෝරා පත් කර ගැනීමේදී ලැයිස්තුවේ ඇති නාමයෝජනා 13න් අවම වශයෙන් 03ක් ශිෂ්‍යාවන් නියෝජනය කළ යුතුය.
- පීඨ ශිෂ්‍ය සමිතියේ නිලධාරීන් හා වෙනත් සාමාජිකයින් තෝරා පත් කර ගැනීමේදී ලැයිස්තුවේ ඇති නාමයෝජනා 13න් අවම වශයෙන් 01ක්වත් විදේශීය ශිෂ්‍ය ප්‍රජාව නියෝජනය කළ යුතුය.

**01. පීඨ ශිෂ්‍ය සමිති සඳහා නාමයෝජනා පත්‍ර භාරගන්නා දිනය හා වේලාව - 2025.07.23 දින පෙ.ව.09.00 සිට පෙ.ව.11.00 දක්වා**

**02. ස්ථානය**

1. වෛද්‍ය පීඨය - වෛද්‍ය පීඨ කාර්යාලය

**03. විරෝධතා ඇතොත් 2025.07.23 දින පෙ.ව. 11.00 සිට පෙ.ව. 11.30 දක්වා ඉදිරිපත් කළ යුතුය.**

ලේඛකාධිකාරි,
කැලණිය විශ්වවිද්‍යාලය,
කැලණිය.

2025.07.03